# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය
# 2023 (2024)
# නාට්‍ය හා රංග කලාව
# I පත්‍රය

**විභාග අංකය ..............................................** **කාලය - පැය 3 යි**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

- **පහත දැක්වෙන කවි, සින්දු හා ගීත ආශ්‍රයෙන් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(I). දුටුවාද ස්වාමි මගෙ ස්වාමි
ලස්සන මුවයා
චර්ම පුල්ලි පේළි සෑදි
නේත්‍ර මාගේ ප්‍රීති වේවි

(II). ඇයිද යකුනි තොපි පෙරළි කරන්නේ
කෑකෝ ගසමින් බෙරි හඬ දෙන්නේ
නිසංසලේ අපි මෙතන සිටින්නේ
එහෙව් අපිට ඇයි තොපි ඉන්ට නොදෙන්නේ

(III). තැන් තැන් වලම ලැගි සන්නන් මුවන් රැළ
ගන්මින් බුදින්නට රස බොජුනා
වන් නෙත් අඳුන් වදු දූ පුත් රුවන් දැක
මන් සන්තොසින් වළඳමි සතොසිනා

(IV). මව්පියො නිදහස් වන්නටා
මාව දුන්නයි නාකි වූ හමෙකුටා
උන්දැල හට කඹුරන්නටා
යැද ඉන්නෙ සුරන් හට දෙස් කොටා

(1). එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍යයට අයත් වන්නේ,

1. I ය. 1. II ය. 1. III ය. 1. IV ය.

(2). කෝලම් සම්ප්‍රදායට අයත් වන්නේ,

1. I ය. 1. II ය. 1. III ය. 1. IV ය.

(3). නූර්ති සම්ප්‍රදායට අයත් ගීත ඛණ්ඩය වන්නේ,

1. I ය. 1. II ය. 1. III ය. 1. IV ය.

(4). බන්දුල ජයවර්ධන විසින් රචිත නාට්‍යයකට අයත් ගීත ඛණ්ඩයක් වන්නේ,

1. I ය. 1. II ය. 1. III ය. 1. IV ය.

➢ **නිවැරදි පිළිතුර තෝරන්න.**

(5). පහත සඳහන් කලා අතුරින් ප්‍රාසාංගික කලා ගණයට ගැනෙන්නේ,

1. සංගීත සංදර්ශන, නර්තන දර්ශන, මුද්‍රා නාට්‍ය සහ ඔපෙරාය
2. සංගීත සංදර්ශන, වේදිකා නාට්‍ය, මූර්ති ඇඹීම සහ ගීත නාට්‍යය
3. මුද්‍රා නාට්‍ය, සාහිත්‍ය ග්‍රන්ථ, වේදිකා නාට්‍ය හා නර්තන දර්ශන
4. රූකඩ, බලි ශාන්තිකර්ම, චිත්‍ර ප්‍රදර්ශන සහ චිත්‍රපට ය.

(6). ''සැප හා දුක මුසු වූ ලෝකයාගේ ස්වභාවය ආංගිකාදී අභිනය මගින් දැක්වෙන කල එය නාට්‍යයයි''පවසනු ලැබේ. මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ,

1. අභිනයදර්පණයෙහි ය. 2. කාව්‍ය ශාස්ත්‍රයෙහි ය.
3. නාට්‍ය ශාස්ත්‍රයෙහි ය. 4. දශරූපයෙහි ය.

(7). ''නෘත්‍ය'' යනු,

1. අංග වික්ෂේප පමණක් ඇති රිද්මයානුකූල නැටුමකි.
2. කිසියම් අර්ථයක් දැක්වෙන තාලාන්විත නැටුමකි.
3. අංග වික්ෂේප පමණක් ඇති තාලාන්විත නැටුමකි.
4. කිසියම් කතා පුවතක් නිරූපණය කරන රැඟුම් ප්‍රභේදයකි.

(8). ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් ලෙස සැලකෙන්නේ,

1. රඟපෑම අතිශෝක්තියෙන් යුතුව ඉදිරිපත් කිරීමයි.
2. සැබෑ ලෝකයට සමාන අයුරින් අභිනය පෑමයි.
3. ප්‍රකෘති ලෝකයක කාල්පනික විලාසයක් මවා පෑමයි.
4. සිදුවීම ශෛලිගත ආකාරයට ඉදිරිපත් කිරීමයි.

(9). නාට්‍යයක් රඟ දැක්වෙන විට අනිවාර්යයෙන්ම සිටිය යුත්තේ කවුරුන් ද?

1. නාට්‍ය අධ්‍යක්ෂකවරයා සහ නළු නිළියන්.
2. ප්‍රේක්ෂකයන් සහ අධ්‍යක්ෂකවරයා.
3. නළු නිළියන් හා ප්‍රේක්ෂකයන්.
4. ගායන ශිල්පීන් හා නළු නිළියන්.

(10). නාට්‍යයක් රූගත කිරීම සඳහා තිබිය යුත්තේ,

1. වේදිකාවක්, කමතක්, කරළියක් හෝ සබයක්.
2. පින්තූර රාමු, වේදිකාවක්, කමත, සරිනාව, කරළිය.
3. පස් ගොඩකර සකස් කරගත් වහලයක් සහිත භූමියක්.
4. රඟ දැක්විය හැකි ඕනෑම ස්ථානයක්.

(11). නාට්‍යයක අනුශාංගික යොදා ගැනීමෙන් අපේක්ෂා කෙරෙන්නේ,

1. රංගභූමිය විචිත්‍රවත් කර ගැනීමයි.
2. වේදිකා මායාව ප්‍රකට කර ගැනීමයි.
3. නළු නිළියන්ට රඟපෑම පහසු කිරීමයි.
4. නාට්‍ය ආලෝකමත් කිරීමයි.

(12). නාට්‍ය පෙළක් රචනා කිරීමේදී,

1. චරිත, සංවාද, රංග විධාන නිරවුල් විය යුතුය.
2. මුල, මැද, අග සහිතව පිළිවෙලින් රචනා කර තිබිය යුතුය.
3. ගැටුම් අවස්ථා නාට්‍යය අවසානයේදී නිරාකරණය කළ යුතුය.
4. නාට්‍ය ගීත අනිවාර්යයෙන් ඇතුළත් විය යුතුය.

(13). රූපණය සඳහා මූලික වශයෙන් අවශ්‍ය වන්නේ,

1. අනුරූපණය, අනුකරණය හා රංග ක්‍රීඩාවය.
2. අනුරූපණය, අනුකරණය හා රංග රචනයයි.
3. අනුරූපණය, අනුකරණය හා සමාරෝපයයි.
4. අනුරූපණය, අනුකරණය හා රංගාලෝකයයි.

(14). රංගභූමි පාලක සතු වගකීම වනුයේ,

1. නළු නිළියන්ට දෙබස් මතක් කර දීමයි.
2. ආලෝකකරණ ශිල්පියාට උපදෙස් දීමයි.
3. අංගරචනා ශිල්පියාට සහය වීමයි.
4. දර්ශනයට අදාල කටයුතු කළමනාකරණය කිරීමයි.

- **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 15 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය අනුවර්තනය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසි විලියම්ස් | අහස් මාළිගා | ක |
| රූඩන්ස් | ප්ලෝටස් | කඹය | ග |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | ජ | හිත හොඳ අම්මන්ඩි | සුගතපාල ද සිල්වා |
| රන් ෆෝ යුවර් වයිෆ් | රේ කුනි | ට | බන්දුල විතානගේ |
| ඩ | ගාර්ෂියා ලෝර්කා | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |

(15). ඉහත වගුවේ ''ක'' කොටුව ඇතුළත් විය යුතු අධ්‍යක්ෂකගේ නම කුමක්ද?

1. සුනන්ද මහේන්ද්‍ර
2. හෙන්රි ජයසේන
3. ජයලත් මනෝරත්න
4. එදිරිවීර සරත්චන්ද්‍ර

(16). ඉහත වගුවේ ''ග'' කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක කවුරුන්ද?

1. බන්ධුල ජයවර්ධන
2. ධම්ම ජාගොඩ
3. පරාක්‍රම නිරිඇල්ල
4. රංජිත් ධර්මකීර්ති

(17). ඉහත වගුවේ ''ජ'' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක්ද?

1. නිකොලොයි ගොගොල්
2. බර්නාඩ් ෂෝ
3. බර්ටෝල් බ්‍රෙෂ්ට්
4. ඇන්ටන් චෙකොව්

(18). ඉහත වගුවේ ''ට'' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?

1. මකරාක්ෂයා
2. රෝමය ගිනිගනී
3. සයුරෙන් ආ ළඳ
4. බිරිඳ වෙතටයි

(19). ඉහත වගුවේ ''ඩ'' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක්ද?

1. ද එල්ඩර් සන් 2. ද ලෝවර් ඩෙප්ත්ඩ්

3. ද පබ්ලික් එනිමි 4. යෙර්මා

(20). මී බන්ධනය නමැති නාට්‍යමය අවස්ථාව ඇති ශාන්තිකර්මය කුමක්ද?

1. කිරි මඩුව 2. දෙවොල් මඩුව 3. පූනා මඩුව 4. පහන් මඩුව

(21). නූතන රංග භූමිය මනඃකල්පිතව බෙදා ඇති කොටස් ගණන කීයද?


1. හයයි. 2. අටයි. 3. නවයයි. 4. දහයයි.

(22). නළු නිළියන් වේදිකා අවකාශයේ චලන රටා ඇති කිරීම,

1. අංග රචනයයි. 2. නර්තන රචනයයි.

3. වේදිකා රචනයයි. 4. රංග රචනයයි.

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් අංක 23 සිට 27 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

|  |  |  |  |  |  |
|---|---|---|---|---|---|
| A | B | C | D | E | F |

(23). තට්ටු ගෙවල්, එකවල්ලේ පොල්, යන නාට්‍ය නිර්මාණය කළේ,

1. A ය. 2. B ය. 3. C ය 4. D ය.

(24). මනමේ නාට්‍යයේ මනමේ කුමරාගේ චරිතය නිරූපණය කර ඇති රංගන ශිල්පියා වන්නේ,

1. A ය. 2. B ය. 3. E ය 4. F ය.

(25). සුබ සහ යස නාට්‍ය නිර්මාණය කළ නාට්‍ය ශිල්පියා වන්නේ,

1. A ය. 2. B ය. 3. D ය 4. E ය.

(26). වීදි නාට්‍ය කලාවට සම්බන්ධ නාට්‍ය කරුවෙකු වන්නේ,

1. B ය. 2. C ය. 3. D ය 4. E ය.

(27). E රූපයෙහි ඇතුළත් රංගන ශිල්පියා රූපකායෙන් දායක වූ නිර්මාණයක් වන්නේ,

1. සුභ සහ යස 2. හුනුවටයේ කතාව

3. නරි බෑනා 4. සිංහබාහු

(28). පිලිප්පුසිංඤෝ විසින් රචනා කරන ලද නාට්‍යයක් වන්නේ,

1. නලරාජ චරිතය ය. 2. රෝමියෝ ජුලියට් ය.

3. පණ්ඩුකාභය ය. 4. ඇහැලේපොළ ය.

(29). කෝලම් නාට්‍යයක අපර රංගය ආරම්භ වන්නේ,

1. රජු හා බිසවගේ සම්ප්‍රාප්තියෙන් පසුව.

2. හේවා කෝළම සබයෙන් නික්ම යාමත් සමඟය.

3. අණබෙර කෝළම සබයට පිවිසීමෙන් අනතුරුවය.

4. මල් පැල පහන් දැල්වීම සහ දේවාරාධනාව කවි ගායනයෙන් පසුවය.

- **පහත දැක්වෙන වෙස් මුහුණු දෙක අතුරෙන් අංක 30 සහ 31 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



**A**



**B**

(30). A හා B යන වෙස්මුහුණු දෙක අනුපිළිවෙලින්,

1. සන්නි මුහුණක් හා කෝලම් මුහුණකි.
2. කෝලම් මුහුණක් හා සන්නි මුහුණකි.
3. සන්නි මුහුණු දෙකකි.
4. කෝලම් මුහුණු දෙකකි.

(31). ඉහත වෙස්මුහුණු දෙක නම් කරන්න.

1. පිස කෝලම හා නොංචි කෝලමය.
2. අමුක්කු සන්නිය හා හේවා කෝලමය.
3. හේවා කෝලම හා ගුල්ම සන්නිය ය.
4. නොංචි කෝලම හා හේවා කෝලමය.

(32). සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාස මගින්,

1. යමක් ආවර්ජනය කොට එය කුමක්දැයි පැවසිය හැකිය.
2. යමක් ස්පර්ශ කොට එය කුමක්දැයි අවබෝධ කර ගත හැකිය.
3. යමක් ආඝ්‍රාහනය කොට එය තිබෙන තැන හඳුනාගත හැකිය.
4. යමක් රසබලා එය කුමක්දැයි පැවසිය හැකිය.

(33). ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය නිෂ්පාදනයෙහිලා පුරෝගාමීව කටයුතු කළේ,

1. නියුමන් ජුබාල්ය  2. ඊ.සී.ජී. ලුඩොවයික් ය.
3. රුවන් ඞී. චිකේරාය  4. ජෙරොම් ලක්ෂ්මන් ද සිල්වා ය.

(34). නාට්‍ය සංගීතය හා නාට්‍ය ගීත අයත්වන අභිනයන් වන්නේ,

1. වාචික අභිනය, ආහාර්ය අභිනය.
2. සාත්වික අභිනය, ආහාර්ය අභිනය.
3. ආහාර්ය අභිනය, වාචික අභිනය.
4. වාචික අභිනය, ආංගික අභිනය.

(35). දෑස් අතර සම්බන්ධතාවය නොගිලි හී පවත්වා ගැනීම මූලික කරගත් රංග අභ්‍යාස වන්නේ,

1. ශිථිලකරණ අභ්‍යාස  2. පරිකල්පන අභ්‍යාස
3. සංවේදන අභ්‍යාස  4. දර්පන අභ්‍යාස

- **ප්‍රශ්න අංක 36 සිට 37 දක්වා නොගැළපෙන පිළිතුර තෝරන්න.**

(36). පහතරට ශාන්තිකර්ම වලට අදාල ප්‍රකාශයකි.

1. යක් බෙරය තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස යොදා ගෙන ඇත.
2. ගම්මඩු දෙවොල් මඩු ප්‍රධාන ශාන්තිකර්ම දෙකකි.
3. නයා යක්කම සහ ඌරා යක්කම ප්‍රහල නාට්‍යමය ජවනිකා දෙකකි.
4. සූනියම් යාගයේ වඩිග බමුණන් දැකිය හැක.

(37). දේශීය ජන සංගීතය හෝ ජන නාට්‍ය ආභාෂය ලබා ගත් නාට්‍යයකි.

1. සක්කාය දිට්ඨි 2. යක්ෂාගමනය 3. දෙපානෝ 4. පරාස්ස

(38). දිගුකාලීන පෙර පුහුණුව මගින් රිද්මයානුකූල චලනයන් හා සමබරතාව වඩාත් ප්‍රකටව පෙනෙන්නේ,

1. ඔපෙරා ශිල්පීන්ගෙන් ය 2. අභිරූපන ශිල්පීන්ගෙන් ය

3. බැලේ ශිල්පීන්ගෙන් ය 4. මුද්‍රා නාට්‍ය ශිල්පීන්ගෙන් ය

(39). නාට්‍යෝපකරණ සෑදිය යුත්තේ.

1. දීප්තිමත් වර්ණ සහ චිත්තාකර්ශනීය බව සලකාය.
2. පහසුවෙන් හා අඩුමිලට ලබාගත හැකි අමුද්‍රව්‍ය වලින්ය.
3. දිලිසෙනසුලු වර්ණවත් අමුද්‍රව්‍ය වලින්ය.
4. නළුවන්ගේ රංග කාර්යයට පහසුවන අයුරින් ය.

(40). නාට්‍ය සංගීතය අවම වශයෙන් යොදා ගැනීම හා ඇතැම්විට යොදා නොගැනීම සිදු වන්නේ,

1. නාට්‍යධර්මී නාට්‍ය වලය. 2. ලෝකධර්මී නාට්‍ය වලය.

3. මුද්‍රා හා බැලේ නාට්‍ය වලය. 4. ළමා හා යොවුන් නාට්‍ය වලදීය.

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය
## 2023 (2024)
## නාට්‍ය හා රංග කලාව
## II පත්‍රය

➢ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් සඳහා පිළිතුරු සපයන්න.**

(1). පහත සඳහන් සංවාද ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිතුරිය 2 - මං නං අපිට නෙමෙයි වගේ අහක බලා ගත්තා.

චන්න - (ඉදිරියට විත් සරදමට) මගෙ ඇඟ ගැහෙන්න ගත්තා. ලැජ්ජාවේ බෑ. (මිතුරිය සමඟ දබරයට මෙන් සැරසේ)

සම්පත් - හා...හා....මේ රණ්ඩු වෙන්නෙ නැතිව මං ඇඳගෙන එනකං මෙතන වාඩිවෙයල්ලා. හැබැයි උඹලා ඔක්කොටම වාඩිවෙන්න අපේ ගෙදර පුටු නම් නෑ.

රංජිත් - පුටු මොනවටද බං. කොන්දයි කකුල් දෙකයි නැවෙනවා නම් ඕන තැනක් සිංහාසනේ තමයි.

මිතුරිය - ඒයි චන්න මට නම් බයේ බෑ බං එන සුමානෙ මොනව වෙයිද කියලා.

i). ඉහත සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය හා එහි අධ්‍යක්ෂවරයා නම් කරන්න. (ල.02)

ii). මෙහි මිතුරිය අහක බලාගත්තේ කුමන සිදුවීමක් සිදුවන විටද? (ල.02)

iii). මෙම නාට්‍යයෙන් සාකච්ඡා කරන්නේ සමාජයේ කුමන තලයක ජීවත්වන පිරිසක් සම්බන්ධවද? (ල.02)

iv). මෙහි සඳහන් සංවාදයෙන් කියවෙන පරිදි එන සුමානයේ සිදුවන්නේ කුමක්ද? (ල.02)

v). මෙම නාට්‍යයෙන් ඉදිරිපත් කෙරෙන ඛේදනීය ඉරණමකට ලක්වන චරිත 2 ක් නම් කරන්න. (ල.02)

vi). මෙම නාට්‍යය තුළින් නිර්මාණකරුවා සමාජයට ලබාදීමට උත්සාහ කරන පණිවිඩය කුමක්ද? (ල.02)

(2). i). උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්තිකර්ම 2 ක් නම් කරන්න. (ල.02)

ii). ඒ එක් ශාන්තිකර්මයක ඇතුළත් නාට්‍යමය ජවනිකා 4 ක් නම් කරන්න. (ල.04)

iii). එකී නාට්‍යමය ජවනිකා අතරින් එකක් තෝරාගෙන ඒ තුළ ඇතුළත් නාට්‍යමය ලක්ෂණ නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ල.06)

(3). i). වේදිකා ආලෝකකරණය සඳහා යොදාගන්නා ප්‍රධාන පහන් වර්ග 2 ක් නම් කරන්න. (ල.02)

ii). ඉන් එක් පහන් වර්ගයක ක්‍රියාකාරීත්වය කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

iii). යම් නාට්‍ය නිර්මාණයක් සඳහා ආලෝකය සපයා ගැනීමේ අරමුණු මොනවාදැයි පැහැදිලි කරන්න. (ල.06)

(4). i). නාට්‍යයක ''ගැටුම'' යන්නට නිර්වචනයක් සපයන්න. (ල.02)

ii). ගැටුමේ ප්‍රභේද නම් කරන්න. (ල.04)

iii). නාට්‍යයක් සඳහා ගැටුමක් අවශ්‍ය වන්නේද? පැහැදිලි කරන්න. (ල.06)

(5). i). ලංකාවේ වඩාත් ජනප්‍රිය නූර්ති රචකයා නම් කරන්න. (ල.02)

ii). ඔහු විසින් නිර්මාණය කළ නූර්ති 4 ක් නම් කරන්න. (ල.04)

iii). නූර්ති රංග ශෛලියේ ලක්ෂණ 3 ක් විස්තර කරන්න. (ල.06)

(6). i). දයානන්ද ගුණවර්ධන විසින් නිර්මාණය කරන ලද නාට්‍ය දෙකක් නම් කරන්න. (ල.02)

ii). ඔබ නම් කළ නාට්‍ය නිර්මාණවල හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ 4 ක් නම් කරන්න. (ල.04)

iii). දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දයානන්ද ගුණවර්ධනගෙන් සිදුවූ සේවය සාකච්ඡා කරන්න. (ල.06)

(7). පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවන් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගලනාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැක.

සෑම දිනම තම යෙහෙළිය වූ යශෝධා පැමිණෙන තුරු දුම්රිය ස්ථානයේ බංකුවක වාඩි වී බලා සිටීමට සුලෝචනා පුරුදු වී සිටියාය. වෙනදා මෙන් එදිනද කෝච්චිය ප්‍රමාද වූයෙන් තම යෙහෙළිය පැමිණෙන තුරු බලා සිටීමට අසල තිබූ බංකුවට බර වුනි. ඈතින් දිස්වන ලී ගේට්ටුව දෙස බැලූ සුලෝචනා දුටුවේ වෙනදා සිනා මුසු මුහුණින් තමා දෙස බලමින් එන යශෝධා වෙනුවට කලබලයෙන් තමා දෙසට දුවගෙන එන යශෝධාගේ මව ය.....

දෙන ලද කථා සාරාංශය ඇසුරු කර ගෙන,

i). පසුබිම, කාලය, චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කර තිබීම සඳහා (ල.04)

ii). චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථා ගොඩනංවා තිබීම සඳහා (ල.04)

iii). නාට්‍යෝචිත අවස්ථා සහිතව නිර්මාණය කර තිබීම සඳහා (ල.04)

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය
# 2023 (2024)
# නාට්‍ය හා රංග කලාව

## පිළිතුරු

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 11 - 2 | 21 - 3 | 31 - 4 |
| 2 - 4 | 12 - 1 | 22 - 4 | 32 - 4 |
| 3 - 1 | 13 - 3 | 23 - 1 | 33 - 2 |
| 4 - 2 | 14 - 4 | 24 - 4 | 34 - 3 |
| 5 - 1 | 15 - 2 | 25 - 3 | 35 - 4 |
| 6 - 3 | 16 - 1 | 26 - 2 | 36 - 3 |
| 7 - 2 | 17 - 3 | 27 - 1 | 37 - 2 |
| 8 - 2 | 18 - 2 | 28 - 4 | 38 - 3 |
| 9 - 3 | 19 - 4 | 29 - 1 | 39 - 4 |
| 10 - 4 | 20 - 2 | 30 - 4 | 40 - 2 |

## II කොටස

01. I. විකෘති, සෝමලතා සුබසිංහ.

II. බසයේ ටිකට් නොමැතිව යන විට පරීක්ෂකවරුන් පරීක්ෂා කරනවා.

III. යෞවනයන් සම්බන්ධව

IV. විභාග ප්‍රතිඵල පිටවීම.

V. ප්‍රියංගනී, සරණපාල

VI. දරුවන්ගේ අපේක්ෂාවන්ට බලපෑම් නොකර සිටිය යුතුයි. දෙමාපිය අපේක්ෂාවන් දරුවන් තුළින් ඉටුකර ගැනීමට නොයා යුතුය.

02. (i). අලුත් සහල් මංගලය, කොහොඹා කංකාරිය, කිරි කොරහා නැටීම.

(ii). කොහොඹා කංකාරිය - ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම, දර්පන යක්කම

(iii). පිළිතුර ලියා ඇති ආකාරය සලකා බලා ලකුණු ලබා දෙන්න. කරුණු 3 ක් වත් විස්තර කර ඇත්නම් මුළු ලකුණු ලබා දෙන්න.

03. (i). යොමු පහන්, ධාරා පහන්, අල්ට්‍රා වයලට් පහන්, බැටන් ලාම්පු, විරබෝල්

(ii). විස්තර කර ඇති කරුණු වලට අනුව ලකුණු ලබා දෙන්න. (කරුණු 3 ක්වත් ලියා තිබුන විට මුලු ලකුණු ලබා දෙන්න.)

(iii). කරුණු 3 ක් වත් විස්තර කර ඇත්නම් මුළු ලකුණු ලබා දෙන්න. කරුණු නම් කොට ඇත්නම් ලකුණු 3 ක් ලබා දෙන්න.

04. (i). චරිත හෝ සිදුවීම් දෙකක් අතර සිදුවන ගට්ටනය ගැටුමයි.

(ii). මිනිසා - මිනිසා අතර

මිනිසා - අභ්‍යන්තර මනෝභාවයන් අතර

මිනිසා - පරිසරය සමඟ

මිනිසා - අදෘශ්‍යමාන බලවේග අතර

05. (i). ජෝන් ද සිල්වා

(ii). වෙස්සන්තර, රමායනය, දස්කොන්, දුටුගැමුණු ආදී ලෙස නිවැරදි පිළිතුර සඳහා ලකුණු ලබා දෙන්න.

(iii). කරුණු 3 ක් විස්තර කර ඇත්නම් මුළු ලකුණු ලබා දෙන්න. කරුණු නම්කොට ඇත්නම් ලකුණු 3 ක් ලබා දෙන්න.

06. (i). ස්වර්ණතිලක, පරාස්ස, බක්මහ අකුණු, ගජමන් පුවත, මධුර ජවනිකා

(ii). දේශීය සංගීතය යොදා ගැනීම

වාර්තා රංග ශෛලියෙන් නිර්මාණය කිරීම

දේශීය ගැමි නාටක/කතන්දර අතුරින් නිර්මාණය කිරිම

දේශීය උරුම නිර්මාණය කිරීම

විචිත්‍රවත් දේශීය නාදමාලා යොදා ගැනීම

(iii). පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න.

07. පිටපත කියවා බලා අභිමත පරිදි ලකුණු ලබා දෙන්න.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න